# තත්කාලීන සමාජයේ පැවැති පුද්ගල නාම හා වෘත්තීන් පිළිබඳව අධ්‍යයනයක් (වෙස්සගිරි ශිලාලේඛන ඇසුරින්)

ගම්මහේගේ වැව අමිත


## Abstract

ඓතිහාසික අනුරාධපුර නගරයට දකුණු දෙසින් පිහිටි තිසා වැව හා තාදාශ්‍රිත ප්‍රධාන පුරාවිද්‍යා ක්ෂේත්‍ර අතුරින් එකක් වශයෙන් වෙසස්ගිරිය හෙවත් ඉස්සරසමණ විහාරය හැඳුනාගත හැකිය. (80 19, 44.9” N/ 800 23’ 16.6” E) ක්‍රි:පූ 3 සියවසයේ සිට ක්‍රි:ව 10 සියවසයට අයත් අභිලේඛන 40කට ආසන්න ප්‍රමාණයක් මෙම වෙස්සගිරිය පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් අනාවරණය කරගෙන අර්ථකථනය කිරීමට සමත්තව ඇත. මෙම අභිලේඛන වසර 1300 පමණ කාලයක් පුරා ව්‍යාප්ත වී තිබේ. 20 වන සියවසයේ මුල් අවධියේ සිටම මෙහි අභිලේඛන සම්බන්ධයෙන් විද්වතුන්ගේ අවධානය යොමු වී ඇත. ලිපි පිහිටුවා ඇති ස්වභාවය අනුව ලෙන් ලිපි, ගිරිලිපි, පුවරු ලිපි හා වෙනත් ලිපි වශයෙන් වර්ග කළ හැකිය. වෙසස්ගිරි පුරාවිද්‍යා භූමියෙන් අනාවරණය කොටගෙන ප්‍රකාශයට පත් කොට ඇති පූර්ව බ්‍රාහ්මී ලිපි සියල්ලම ගුහා කටාරමට පහලින් සටහන් කර ඇත. අපර බ්‍රාහ්මී යුගයට අයත් ලිපි සියල්ලම පර්වත මත ලියූ ගිරිලිපි වේ. සමකාලීන සමාජයේ සැකැස්ම පිළිබඳව කදිම නිදර්ශන රැසක් වෙසස්ගිරි ශිලා ලේඛන මගින් අනාවරණය කරයි. මෙම ලිපි අධ්‍යයනය කරලීම තුළින් තත්කාලීන සමාජයේ පැවැති පුද්ගල නාම, විවිධ වෘත්තින් හා ඥතිත්තවයන් හඳුනා ගත හැකිය. මෙම පර්යේෂණයේ දි මෙතෙක් වාර්තා කර ඇති ශිලාලේඛනයන්ගේ සඳහන් පුද්ගලනාම හා වෘත්තීන් පිළිබඳව අවධානය යෝමු කරණ ලදි. මේ සම්බන්ධව අල්ප වශයෙන් මෙතෙක් අවධානය යොමු කර ඇති අතර එම ඌණපූරණය සම්පූර්ණ කිරිමේ අරමුණින් හා වෙසස්ගිරි ශිලාලේඛන තුළින් ඉදිරිපත් කරන පුද්ගල නාම හා විවිධ වෘත්තීන් මොනවා ද? යන ගැටලුවට පිළිතුරු සැපයීමට ශිලා ලිපි අධ්‍යයනයෙන් මෙම පර්යේෂණය සිඳු කරන ලදි. මෙහි දී දත්ත රැස් කිරිමේ දී ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර නොවන හා ක්ෂේත්‍ර අධ්‍යයනය යන ක්‍රමවේදයන් භාවිතා කරණ ලදි. ක්ෂේත්‍ර නොවෙන අධ්‍යයනය යටතේ පුස්තකාල සමීක්ෂණය මගින් සෘජුව හා වක්‍රව තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කරන ලදී. මාතෘකාවට සම්බන්ධ ස්ථානයන්හි ඡායාරූප අධ්‍යයනයෙන් පූර්ව දැනුම ලබා ගන්නා ලදී. මූලිකව ම දත්ත රැස් කිරීම ක්ෂේත්‍ර සමීක්ෂණය යටතේ සිදු විය. වෙස්සගිරිය ආශ්‍රිතව ඇති ශිලාලේඛන අධ්‍යයනය මගින් මෙම පර්යේෂණය සඳහා අදාළ දත්ත රැස් කරන ලදී.


**ප්‍රමුඛ පද** - වෙසස්ගිරිය, ශිලාලේඛන, පුද්ගල නාම, වෘත්තීන්

### හැඳින්වීම

ඓතිහාසික අනුරාධපුර නගරයට දකුණු දෙසින් පිහිටි තිසා වැව හා තාදාශ්‍රිත ප්‍රධාන පුරාවිද්‍යා ක්ෂේත්‍ර අතුරින් එකක් වශයෙන් වෙසස්ගිරිය හෙවත් ඉස්සරසමණ විහාරය හැඳින්විය හැකිය. (80 19, 44.9” N/ 800 23’ 16.6” E) මෙහි ශිලා ලේඛනයන් ක්‍රි:පූ 3 සියවසයේ සිට ක්‍රි:ව 10 සියවසය දක්වා වසර 1300 පමණ කාලයක් පුරා ව්‍යාප්තව ඇති අභිලේඛන 40කට ආසන්න ප්‍රමාණයක් මෙම වෙස්සගිරිය පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් අනාවරණය කරගෙන අර්ථකථනය කිරීමට සමත්තව ඇත. 20වන සියවසයේ මුල් කාලයේ සිටම මෙම අභිලේඛන සම්බන්ධයෙන් අවධානය යොමු වී ඇත. ලිපිවල ස්වභාවය සැලකිමේ දි ලෙන් ලිපි, ගිරිලිපි, පුවරු ලිපි හා වෙනත් ලිපි වශයෙන් මෙම ස්ථානයේ දක්නට ලැබෙන ලිපි වර්ග කළ හැකිය. වෙසස්ගිරි පුරාවිද්‍යා භූමියෙන් අනාවරණය කොටගෙන ප්‍රකාශයට පත් කොට ඇති පූර්ව බ්‍රාහ්මී ලිපි සියල්ලම ගුහා කටාරමට පහලින් සටහන් කර ඇත. අපර බ්‍රාහ්මී යුගයට අයත් ලිපි සියල්ලම පර්වත මත ලියූ ගිරිලිපි වේ. සමකාලීන සමාජයේ සැකැස්ම පිළිබඳව කදිම නිර්නායකයක් වශයෙන් වෙසස්ගිරි ක්ෂේත්‍රය පුරා විහි දි ඇති මෙම ලිපි හඳුනාගැනීමට පුළුවනි. මෙම ලිපි අධ්‍යයනය කරලීම තුළින් තත්කාලීන සමාජයේ පැවැති පුද්ගල නාම, විවිධ වෘත්තින් හා ඥතිත්තවයන් හඳුනා ගත හැකිය. මෙම පර්යේෂණයේ දි මෙතෙක් වාර්තා කර ඇති ශිලාලේඛනයන්ගේ සඳහන් පුද්ගලනාම හා වෘත්තීන් පිළිබඳව අවධානය යෝමු කරණ ලදි.

**පර්යේෂණ ගැටලුව**

වෙස්සගිරිය ශිලාලේඛනයන්හි දක්වා ඇති තත්කාලීන සමාජය වෘත්තින් කෙසේ ක්‍රියාත්මක වූයේ ද ඒ කුමක් දැයි යන ගැටලුව මෙන් ම එහි සඳහන්වන පුද්ගල නාමයන් මොනවාද යන ගැටලුත් මෙම පර්යේෂණයට ප්‍රධාන වශයෙන් තුඩුදුන් ගැටලුවයි.

**පර්යේෂණ අරමුණු**

වෙස්සගිරි පුරාවිද්‍යාත්මක පරිශ්‍රය තුළ සඳහන් කර ඇති ශිලාලේඛන ලාංකේය ඉතිහාසය ගොඩනැංවීමට පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙන් මහෝපකාරී වන ශිලාලේඛන රැසක්ම දක්නට ලැබේ. මෙම ශිලාලේඛන මගින් තත්කාලීන සමාජයේ බඳුක්‍රම, ජල කළමනාකරණය, ආගමික උත්සව, විවිධ වෘත්තීන්, ස්ථාන හා පුද්ගල නාම සඳහන් වේ. මෙ මගින් සමාජ පසු බිම මනා ලෙස ප්‍රතිනිර්මාණය කළ හැකිය. මෙහි දක්නට ලැබේන ශිලාලේඛන රැසකම විවිධ වෘතින් හා පුද්ගල නාමයන් දක්වා ඇත. මෙහි ප්‍රධානතම අරමුණ වන්නේ ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ දී දත්ත රැස්කිරිම සඳහා ප්‍රධාන වශයෙන් අධ්‍යයන ක්‍රමවේද දෙකක් භාවිත කරන ලදී. ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය. ක්ෂේත්‍ර නොවෙන අධ්‍යයනය යටතේ පුස්තකාල සමීක්ෂණය මඟින් මෙම අධ්‍යයනයට අදාළව සෘජුව හා වක්‍රව තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කරන ලදී. එසේ ම මෙහි දී මාතෘකාවට සම්බන්ධ ස්ථානයන්හි ඡායාරූප අධ්‍යයනය මඟින් පූර්ව දැණුවත් භාවයක් ලබා ගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී මූලිකවම දත්ත රැස් කිරීම ක්ෂේත්‍ර සමීක්ෂණය යටතේ සිදු කරන ලදී. වෙස්ස ගිරිය ආශ්‍රිතව දක්නට ලැබෙන ශිලාලිපි අධ්‍යයනය මඟින් මෙම පර්යේෂණය සඳහා අදාළ දත්ත රැස් කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

වෙස්සගිරි පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් මේ වනතෙක් අනාවරණය කොටගෙන ප්‍රකාශයට පත්කොට ඇති ආදීම අභිලේඛන ප්‍රමාණය 23කි (වික්‍රමසිංහ 1904-1912:11-14; Paranavitana 1970:6-7). ක්‍රිස්තුපූර්ව 3 සියවස හා ක්‍රිස්තු වර්ෂ 1 සියවස අතර කාලයට අයත් පූර්ව බ්‍රාහ්මී අක්ෂරයන්ගෙන් රචනාකොට ඇති මෙම ලිපි සියල්ලම සිංහල ප්‍රාකෘත බසින් ලියා ඇත. වෙස්සගිරි මධ්‍යම හා දක්ෂිණ පර්වත සංකීර්ණයන්ගෙ ඇති ගල්ගුහා කටාරම් කපවා වාසය කිරීම සඳහා යෝග්‍ය පරිදි සකස් කොට සංඝයා වෙත කැපකිරීම පිළිබඳ විස්තර මේ සියල්ලේ ම පාහේ අන්තර්ගතය වී ඇත. මෙහි දක්නට ඇති ලිපි අතුරින් අතිශය බහුතරය උත්තර ඉන්දීය බ්‍රාහ්මී සම්ප්‍රදාය නිරූපණය කරන අතර අතිශ්‍ය සීමිත අක්ෂර සංඛ්‍යාවක් පමණක් දක්ෂිණ භාරතීය අක්ෂර සම්ප්‍රදාය නිරූපණය කරයි. සමකාලීන සමාජයේ සැකැස්ම පිළිබඳ කදිම නිර්ණායකයක් වශයෙන් වෙස්සගිරි ක්ෂේත්‍රය පුරා විහි දී ඇති මෙම ලිපි හඳුනාගැනීමට පුළුවන. එම ලිපි අතුරින් සමකාලීන සමාජයේ ජීවත් වූ විවිධ ජන කොටස් සම්බන්ධ ව පුද්ගල නාම පද සමඟ යෙදී ඇති විවිධ අභිධාන මඟින් පැහැදිළි වෙයි. පරණවිතාන විසින් පාමෝක්ඛ යන්නෙන් බිදී එන ලෙස සලකන පරුමක යන අභිධානය ඇතුළු විවිධ අභිධාන රැසක් මේ ලිපි ඇසුරින් හඳුනාගත හැකි ය.

මෙම අභිධාන විශ්ලේෂණය කිරීමේ දී සමාජයේ විවිධ ස්ථර නියෝජනයක් එතුළ පවත්නා බව පෙනේ. ඒ අනුව ගමික, බත, පරුමක වැනි සමාජයේ පාලන සංවිධානය හා සම්බන්ධ තනතුරු දැරූ පිරිස් පිළිබඳ ව නියෝජනයක් පිළිබඳ මෙයින් අනාවරණය වෙයි. ඒ තුළින් ස්ථර කීපයක නියෝජනයක් හඳුනාගත හැකි අතර බලය බෙදී යාම පිළිබඳ අදහසක් එයින් ගම්‍ය වන බව උපකල්පනය කිරීමට හැකි ය. අණිකට, තලදර, වමකරක, සණ-චොදක ආදී විවිධ වෘත්තීය කොටස් රැසක් පිළිබඳ ව මෙම ලිපි ඇසුරින් හඳුනාගත හැකි වෙයි. උක්ත සාකච්ඡා කළ පාලනය හා සම්බන්ධ පිරිස්වලින් පසුව මෙවැනි වෘත්තීය පිරිස් හෝ කණ්ඩායම් පිළිබඳ සාධකය වැදගත් නිදර්ශකයකි. සමකාලීන සමාජයේ විවිධ වෘත්තිකයන් විසූ බවත් ඔවුන් ආර්ථික හා සමාජ වශයෙන් බලවත් ව සිටි බවත් මෙයින් ජනිත වන අදහසකි. මේ ආකාරයෙන් සමකාලනී සමාජයේ ජීවත් වූ විවිධ වෘත්තීය පිරිස් වෙස්සගිරි ක්ෂේත්‍රය හා අනුබද්ධ භූමිය සමඟ සමීපස්ථ සබඳතාවක් දැක් වූ බව මේ අභිලේඛන අනුව තහවුරු වෙයි. ඒ අනුව එම සමාජයේ ඓතිහාසික භූ දර්ශනයේ තවත් පැතිකඩක් හඳුනා ගැනීමට හා ඒ පිළිබඳ අධ්‍යයන සිදුකිරීම සඳහා මේ මඟින් අවස්ථාව විවර වෙයි.

වෙස්සගිරි ශිලාලේඛනයන්හි ඉහත සඳහන් කළ පරිදී නොයෙකුත් වෘත්තීන් තත්කාලීන සමාජ පසුබිම තුළ ගොඩනැගී තිබේ. රාජ්‍ය පාලනය හා ඍජු දායකත්වයක් සපයන ලද රාජ්‍ය සේවකන් වශයෙන් ඔවුන් ක්‍රියා කොට ඇති බව සිතිය හැකිය. රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක කරන ලද විවිධ සංස්ථා සඳහා පරිපාලකයන් පත් කොට ඇත. ඔවුන් විසින් අනුගමනය කළ යුතු නීතිරීති මාලවක් ද යොදා තිබෙන්ට ඇති බව විස්වාස කළ හැකිය. වාර්තමාන සමාජයේ මෙන්ම භාණ්ඩ නිෂ්පාදන කරලීම සඳහා අවධානය යොමු කොට තිබේ. ආයුධ, ආභරණ ආදි දෑ නිෂ්පාදනය කරණ ලද වෘත්තියන් පිළිබඳව

මෙම ශිලාලේඛනයන්හි සඳහන් වේ. එසේම තත්කාලීන සමාජයේ ප්‍රබලතම කාර්යය වුයේ කෘෂිකාර්මික කටයුතු සිඳු කිරීමයි. එම කාර්ය නිසි අයුරින් සිදු කරලීම සඳහා රාජ්‍ය නිළ ධාරීන් පත් කොට තිබේ. වෙසස්ගිරි ශිලාලේඛනයන්හි එම වෘත්තියන් පිළිබඳව සඳහන් වේ.

ආගමික සම්බන්ධතාව ඔස්සේ විවිධ පිරිස් අතුරින් සමානාත්මතා නියෝජනයක් ප්‍රකාශ කරමින් බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන උපසක, උපශිකා හා ශමණි ආදී සිව්වනක් පිරිස පිළිබඳ ව නිදසුන් මෙම ලිපි තුළින් අනාවරණය කරගත හැකි වීම වැදගත් කරුණකි. බුදුදහමේ ආභාෂය ඔස්සේ විවිධ පිරිස් උක්ත සිව්වනක් පිරිස ලෙස ක්‍රිස්තු පූර්ව යුගයේ දී ම සංවිධානය වීම සැලැකිය යුතු සංසිද්ධියකි. උක්ත සාකච්ඡා කළ අභිධානයනට අමතර ව ස්ථාන නාම, ඥාතිත්වය හඟවන පද මෙන්ම පුද්ගල නාමයන් ද මෙම ලිපි තුළින් හඳුනාගැනීමට පුළුවන.

| | ස්ථාන නාමය | සිංහල අර්ථය | අභිලේඛන අංකය |
|---|---|---|---|
| 1 | ගිරිවජේ | ගිරිබ්බජ ලෙන | 91 |
| 2 | හරිටිමත | ශාරිටීමාත්‍ර ලෙන | 93b |

**වගු අංක 01 - වෙස්සගිරියේ පූර්ව බ්‍රාහ්මී අභිලේඛනයන්ගේ දැක්වෙන ස්ථාන නාම**

| | පුද්ගල නාම | සිංහල අර්ථය | අභිලේඛන අංකය |
|---|---|---|---|
| 1 | කුමර | කුමාර | 91 |
| 2 | චිත | චිත්තා | 79 |
| 3 | තිශ | තිස්සා | 77, 82, 84, 85, 91 |
| 4 | දත | දත්තා | 86 |
| 5 | දමරකිත | ධම්ම රක්ඛිත | 76 |
| 6 | දෙව | දේව | 80 |
| 7 | නාග | නාග | 80 85 |
| 8 | මහ මරුමස | මහහරුම | 81 |
| 9 | පාල | පාල | 90 |
| 10 | පලකද | පලකද | 79, 81, 82 |
| 11 | පුශ | පුස්ස | 93 |
| 12 | යගදත | යාගදත්ත | 92 |
| 13 | යහශනි | | |
| 14 | යශොබල | යසපාල | 92 |
| 15 | රෙත | රෙත | 87 |
| 16 | විශදෙව | විසදේව | 88 |
| 17 | ශුමන | සුමන | 83, 93 |
| 18 | ශුරක්ත | සුරක්ඛිත | 79 |
| 19 | ශොණ | ශෝණ | 79 |
| 20 | සොණුත්තර | සොණුත්තර | 83 |
| 21 | සුමන | සුමන | 88 |
| 22 | හරුම | හරුම | 78 |

**වගු අංක 02 - වෙස්සගිරියේ පූර්ව බ්‍රාහ්මී අභිලේඛනයන්ගේ දැක්වෙන පුද්ගල නාම පද**

මෙහි දැක්වෙන සියළු ලිපි තුළ ඥාතීත්ව පද 5ක නියෝජනයක් දක්නට ලැබෙන අතර ඒවායින් 3ක් පුරුෂ හා 2ක් ස්ත්‍රී ඥාතීත්ව පදයි. ඒ සියල්ල ම පාහේ තනතුරු දැරූ පුරුෂ මූලයන් හා සබදකර දැක්වීමට උත්සාහ කර ඇති බව හඳුනාගත හැකි වෙයි. මේ අතර ස්ථාන නාම දෙකක් දැකගත හැකි

අතර ඒවා මෙම ස්ථානයේ ම ඇති ලෙන් සඳහා භාවිත කරන ලද නම් වේ. ඒ හැරුණු විට පුද්ගලයන් සඳහා භාවිත එකිනෙකට වෙනස් නාම පද 20කටවැඩි සංඛ්‍යාවක් හඳුනාගත හැකි අතර ඒවායින් අතිශ්‍ය බහුතරය පුරුෂ පාර්ෂවය සඳහා භාවිත කරන ලද ඒවා වෙයි.

ක්‍රිස්තු වර්ෂ 1 සියවස හා ක්‍රිස්තු වර්ෂ 3 සියවස අතර කාලයට අයත් කළ හැකි අභිලේඛන 10ක් මේ වනතෙක් ප්‍රකාශයට පමුණුවා ඇත එම ලිපි මඟින් ද සංඝයා සඳහා කළ විවිධ පරිත්‍යාග පිළිබඳ තොරතුරු ප්‍රකාශ වෙයි. ඒ අතුරින් මධ්‍යම පර්වත සංකීර්ණයේ දැකගත හැකි අභිලේඛන 4ක් වැදගත් වෙයි. සමකාලීන සමාජයේ විහාර ආශ්‍රිත ව සිටි වහළුන් හා ඔවුන් සේවයෙන් මිදවීම පිළිබඳ එම ලිපි මඟින් දැක්වෙයි එහෙත් මෙම ලිපිවල අන්තර්ගතය පිළිබඳ ව අවධානය යොමුකළ විට පෙනී යන්නේ තමා ම හෝ වෙත් තැනැත්තෙකු හෝ තැනැත්තියක සංකේතාත්මක ලෙස වහලෙකු වශයෙන් විහාරයට පූජා වී හෝ පූජාකර අදාළ පුද්ගලයා මිදවීම සඳහා විහාරයට මුදල් ලබාදුන් බවයි. අනතුරු ව එම මුදලින් තමනට හා සියළු සත්වයනට මෙලොව හා පරලොව වශයෙන් යහපතක් ප්‍රාර්ථනා කළ බවයි. මෙම ක්‍රියාව හා එය අවසානයේ සිදුකරන ප්‍රාර්ථනය අනුව මෙය වැඩි වශයෙන් මහායානික නැඹුරුතාවක් දක්වන බව නීර්ණය කිරීමට හැකි වෙයි.

**සමාලෝචනය**

ශ්‍රී ලාංකීය ඉතිහාසය ගොඩනැගිමේ දී අභිලේඛන මූලාශ්‍රය වශයෙන් මනා දායකත්වයක් සපයයි. මෙරට ශිලාලිප පිහිටුවීම මහින්දාගනයත් සමඟ ආරම්භ වූ බව සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාව පුරා ශිලාලේඛන රැසක් මේ වනවිට අනාවර්ණය කරගෙන ඇති අතර අනුරාධපුර පූජනීය ස්ථානයන්හි ශිලාලේඛනයන් පිහිටුවා ඇති අතර වෙසස්ගිරියට ප්‍රමුඛස්ථානයක් ලැබේ. බ්‍රාහ්මීය අක්ෂර යොදාගෙන මෙහි ශිලාලේඛන රැසක්ම නිර්මාණය කර ඇත. සමස්ථයම පොදුවේ අධ්‍යයනය කිරීමේ දී සාසනික පූජාවන් පිළිබඳව සඳහන් වේ. එනමුත් එහි සඳහන් කරුණු පිරික්ෂීමේ දී ඓතිහාසික තොරතුරු රැසක්ම අනාවර්ණය කර ගැනීමට හැකි වේ. තත්කාලීන සමාජයේ ආගමික දේශපාලනික සමාජීය තොරතුරු අනාවර්ණය කරගත හැකිය. මෙහිදි අවධානය ලක් කරන ලද්දේ එම ශිලාලේඛනයන්හි සඳහන්වන විවිධ වෘත්තීන් පුද්ගල නාම හා ස්ථානීය නාමයන් සම්බන්ධවයි. අනුරාධපුර රාජධානිය සමයේ වෙස්සගිරිය පූජා භූමිය ගොඩනගන ලද්දකි. එම සමය තුළ ක්‍රියාත්මක වූ වෘත්තින් හා වෘත්තිකයන් පිළිබඳව ඇතැම් ස්ථානයන්හි සඳහන් වේ. එම වෘත්තින් මොනවාද යන්න පිළිබඳව විමර්ශණය සිදු කළ අතර සංවිධානාත්මක රාජ්‍ය පරිපාලනයක් ගෙන ගිය බව ඒ තුළින් අවබෝධ කරගත හැකිය. මෙම ශිලාලේඛනයන්හි ස්ථාන නාම හා පුද්ගල නාම රැසක් හඳුනාගත හැකිය. එම නාමයන්හි අර්ථකතනයන් දැක්වීම ද මෙම පර්යේෂණය තුළින් සිදු කළ අතර මේ අනුව තත්කාලින සමාජයේ අගනා තොරතුරු රැසක්ම අනාවර්ණය කරගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


වික්‍රමසිංහ, ඩී. එම්. ඩී. ඉසෙඩ්. 1904-1912- වෙස්සගිරි සෙල්ලිපි, ශිලාලේඛන සංග්‍රහය, I වෙළුම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ, 7-24.

අඹන්වල, සී. 2006 - වෙස්සගිරි ගුහා අංක 01-2006 පර්යේෂණ කැනීම මූලික කැනීම් වාර්තාව, පළමුවැනි පුරාවිද්‍යා පර්යේෂණ වාර්තාව ( 2006 මැයි දෙසැම්බර්) , ජේතවන ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය, 49-75. (අප්‍රකාශිතය) 2009.

දේවේන්ද්‍ර, ඩී. ටී. 1961 - අනුරාධපුර නගර නිර්මාණය, අනුරාධපුර යුගය , සංස්. ඒ. ලියනගමගේ හා ආර්. ගුණවර්ධන, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, 305-312.